
## 1.1 පසුබිම

### I. පිහිටීම

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18 අතරින් 17 වන ස්ථානය ගන්නා කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විශාලත්වයෙන් හෙක්ටයාර් 8100කි.

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරින් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් ඇලපාත හා අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ද නැගෙනහිරින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, බටහිරින් කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද මායිම්ව ඇත.

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 17 කින් සමන්විත වන අතර ප්‍රධාන වශයෙන් ගම්මාන 53 කි.




**i.සිතියම**


## II. භූ විෂමතාව

භූ විද්‍යාත්මක ව බලන කළ වෙරළ මායිමේ නොපිහිටිය ද ලංකාවේ උන්නතාංශයමත කරන ලද බෙදීම්වලට අනුව මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙරළබඩ තැන්නට මෙන්ම අඩ තැන්නට ද අයත් වේ. සම්පූර්ණ භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 81 පමණ වන අතර සාමාන්‍යයෙන් මෙම කොට්ඨාසය සංකීර්ණ භූවිෂමතාවයකින් යුක්ත නොවේ. එහෙත් කොට්ඨාසයේ බටහිර සීමාවට වන්නට සංකීර්ණ භූවිෂමතාවයක් දක්නට ලැබේ. ඉහල උච්චත්වයකින් යුක්ත කඳුකර පවතින්නේ ඉතා සුළු ප්‍රමාණයෙනි.

ප්‍රදේශයේ උපරිම උච්ඡත්වය අඩි 1163 ක් වන අතර, එය අවුකනගල ත්‍රිකෝණමිතික ස්ථානය ඇසුරින් දක්වා ඇත. ප්‍රදේශයේ භූ විෂමතා දෙස බලන කළ උපරිම උච්ඡත්වය දක්වන ස්ථාන ලෙස මුණසිංහපුර හා හාන්දුකන්ද වසම් සැලකිය හැකි ය. දිවයිනේ වර්ග ප්‍රමාණය ගණනය කිරිම සඳහා භාවිතා කළ ත්‍රිකෝණමිතික ස්ථාන රාශියක් කොට්ඨාසයේ දක්නට ඇත. ඒවා අතුරින් අඩි 1147 උස් වූ කොණ්ඩගල, අඩි 1163 ක් උස් වූ අවුකනගල ද මෙම කොට්ඨාසය තුළ පිහිටා ඇත.

ප්‍රාදේශික ව බලන කළ නැගෙනහිර අර්ධය උසින් අඩු ම කලාපය ලෙස දැක්වේ. එය කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම් ව පිහිටි කොටසයි. අඩි 500 ට අඩු උන්නතාංශයක් දක්වන මෙම කලාපය යටතට පුළුල්ව අයත්ව පවත්නා ග්‍රාම නිලධාරී වසම් කිහිපයකි. දෙහෙරගොඩ, කනුග්ගල්ල, මුදුන්කොටුව, බ/දොඩම්පේ, දොඩම්පේ, මෙම ග්‍රාම නිලධාරී වසම් ය.


මූලාශ්‍ර - (කිරිඇල්ල ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මෙන් හා සම්පත් පැතිකඩ ආශ්‍රයෙන්)




**සිතියම** මූලාශ්‍ර - (කිරිඇල්ල ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මෙන්)

## III. දේශගුණය

මෙම කොට්ඨාසය පහතරට තෙත් 1a (WL1a), යන කෘෂි පාරිසරික කලාපයට අයත් වේ. මෙය සිතියම් අංක 1.1.3 පෙන්වා දී ඇත. මෙම කොට්ඨාසයේ විශාල දේශගුණික විවිධත්වයක් දක්නට නැත.




iii. සිතියම මූලාශ්‍ර - (කිරිඇල්ල ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මෙන්)

## IV. වර්ෂාපතනය

මෙම කොට්ඨාසයේ ලංකාවේ භූවිෂමතාවය අනුව වාර්ෂික වර්ෂාපතනය මි.මි. 3200 ට වැඩි වර්ෂාපතනයක් ලැබෙන තෙත් කලාපයට අයත් වුවකි. එහි වාර්ෂික වර්ෂාපතනය මි.මි. 4000 ඉක්මවා ඇත. වැඩිම වර්ෂාපතනයක් අප්‍රේල් සිට ජුනි මාසවලත්, සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා මාසවලත් ලැබේ. වර්ෂාපතනය වැඩිම මාසයේ අගය මි.මී.360ක් පමණ වේ. අඩුම වර්ෂාපතනයක් ජනවාරි පෙබරවාරි මාසවල දක්නට ලැබෙන අතර, එය මි.මී 50ක් පමණ වේ. වර්ෂාපතනය ප්‍රධාන වශයෙන් නිරිතදිග මෝසම් සුළං කාලවලදී ලැබේ.

## V. උෂ්ණත්වය

ලංකාවේ භූ රූපණ කලාප බෙදීම්වලට අනුව කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය නිරිතදිග වෙරලබඩ තැන්නටත්, අඩතැන්නටත් අයත් වේ. තෙත් කලාපයට අයත්වන්නා වූ මෙම කොට්ඨාසය පහත් බිම් හා මධ්‍ය උෂ්ණත්වයක් දක්වන්නා වූ භූමි කොටසකින් සමන්විත වේ. සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 28 පමණ වන අතර, වැඩිම උණුසුම අගෝස්තු මාසයේදී පවතින අතර, සිසිල් මාසය දෙසැම්බර් වේ.

## VI. පස


විශාල භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවත්නා පාෂාණ විශේෂය ලෙස උස් බිම් ශ්‍රේණියට අයත්, පොදු ව්‍යවහාරයේදි කළුගල් වශයෙන් දක්වන්නා වූ, පාෂාණ විශේෂය දිය ඇලි ආශ්‍රිත ව පිහිටයි.

## VII. ජලවහනය

කොට්ඨාසයේ ජලවහන රටාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය ලෙස භූමියෙහි පවත්නා රළු විෂමතාවය වැදගත් ය. කොට්ඨාසයේ උතුරු දෙසින් පටන් ගන්නා ජලවහන මණ්ඩලය දකුණු දිශාගත ව ගමන් කර ඇත.

මෙම සියලු ම ජලවහන ද්‍රෝණි කළු ගඟට සම්බන්ධ වේ. මෙයින් නිරූපණය වන්නේ සිතියම් ගත කොටසේ පහත්ම කොටස දකුණු මායිම් ආශ්‍රිත කොටස බවයි. උතුරු දකුණු දිශාගත ව අනුක්‍රමණයක් පවත්නා බව මින් නිරූපණය වේ.

කළු ගඟට ජලය සපයන ප්‍රධාන අතු ගංගාව ලෙස ''**එල්ලාවල ඔය**'' හඳුන්වා දිය හැකිය. මෙයට කුරු ගඟ සම්බන්ධ වන අතර මෙම අතු ගංගා දෙක එකතුව තුළින් ප්‍රධාන ජල වහන ද්‍රෝණිය සකස් වී ඇත. මෙම ප්‍රධාන ජලවහන ද්‍රෝණියට අමතර ව තව ජල වහන ද්‍රෝණි 9 ක් කළු ගඟට සම්බන්ධ වේ. ඒ අතුරින් ' '**වලයල් ඔය**'' සහ "**කරඳන ඇල**'' ප්‍රධාන වේ. මේ අනුව කොට්ඨාසය තුළ පැතිරුණ ජල වහන පද්ධතියක් ඇති බවපැහැදිලි වේ. කොට්ඨාසයේ දකුණු සීමාව ලෙස ක්‍රියාත්මක වන "**කළු ගඟ**'' වැඩි දුරක් ගමන් කර ඇත්තේ හොලිපිටිය, දොඩම්පේ, බ/දොඩම්පේ හා ඉඩංගොඩ වසම්වලට මායිම්ව ය.




vii.සිතියම මූලාශ්‍ර - (කිරිඇල්ල ප්‍රාදේශීය ඉඩම පරිහරණ සැලැස්මෙන්)

## VIII. කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගංගා ,ඇළ ,දොළ,වැව්

| | |
|---|---|
| කළු ගඟ | මිල්ලගහ ලියැද්ද ඇළ |
| කුරු ගඟ | අධිකාරිය ඇළ |
| එල්ලාවල ගඟ | වල්ලහල දොළ |
| ගල්පොත්තහේන වැව | බෙරලිය දොළ |
| අධිකාරිය වැව | ඉන් දොළ |
| මනන් ඇල්ල | මහ දොළ |
| උඩුකුඹුර ඇළ | දේරගාල දොළ |
| ගල්ලැල්ල ඇළ | කුකුළුගල දොළ |
| ගෝනි ඇළ | අඩගහදොල හල්දොල |
| වැල්ලගහ ඇළ | ගිලමෙ දොළ |
| තිබ්බොටු ඇළ | කට්ටඩි දොළ |
| දං ගස් ඇළ | වේවැල් දොළ |
| කැටකඩ ඇළ | මැණික් දොළ |
| යටිපව්ව ඇළ | තේ මළුව වත්ත ඇළ |
| කොට ඇළ | හල් කද දොළ |
| වැලි අදුර දොළ | හිරිමිනන ඇළ |
| කොටහළුව දොළ | කෙටලපත්තල ඇළ |
| බෝගොඩ දොළ | මුංගංදොළ |
| කැකුණදොළ | පේරගස්වත්ත දොළ |
| පින්නගොල්ල දොළ | ආහරණ දොළ |

## IX. සංරක්ෂිත ජල උල්පත්

| අනු අංකය | නම | සංරක්ෂිත වර්ෂය | අයත් වසම |
|---|---|---|---|
| 1 | තහංදිකැලේ මූකලාන | 2004 | ඇල්ලගාව |
| 2 | හල්දොළ අමුණ | 2007 | ඉඩංගොඩ |
| 3 | බෙරලිය දොළ ඉහල | 2007 | ඇල්ලගාව -කළුවාවලතැන්න ග්‍රාමය |
| 4 | ගල්වල පීල්ල | 2009 | ඉඩංගොඩ |
| 5 | හකුරු වැටුණු දොළ කොටසක් | 2013 | කිරිඇල්ල |
| 6 | කුකුලගල දොළ කොටසක් | 2014 | එපිටවල |
| 7 | බෝගොඩ දොළ කොටසක් | 2015 | යටිපව්ව |
| 8 | වේවැල්දොළ | 2015 | එල්ලාවල |
| 9 | රත්නම්වත්ත ජල මූලාශ්‍රය | 2016 | දොඩම්පේ |
| 10 | පීල්ල දොල | 2016 | එල්ලාවල |
| 11 | මනන් ඇළ කොටසක් | 2016 | එල්ලාවල පහලගම |
| 12 | පහලකන්ද ඇළ | 2016 | අකුරණ |
| 13 | නාවලහේන දොළ | 2017 | මාටුවාගල |
| 14 | දියහොඳ දොළ | 2017 | මාටුවාගල |
| 15 | වල්ලගල දොළ | 2018 | ඇල්ලගාව |

## X. ජල උල්පත් හා ජල රක්ෂිත පිළිබඳ තොරතුරු

| අනු අංකය | ජල උල්පතේ නම | පිහිටි ග්‍රා.නි. වසම | පිහිටි ස්ථානය |
|---|---|---|---|
| 1 | කඳුරුඅත්ත ජල මූලාශ්‍රය | මාටුවාගල | මාටුවාගල වත්ත |
| 2 | හල්දොල ජල මූලාශ්‍රය | මාටුවාගල | මාටුවාගල වත්ත |
| 3 | කැතිගාන දොළ ජල මූලාශ්‍රය | මාටුවාගල | මාටුවාගල වත්ත |
| 4 | පහලකන්ද ඇල | අකුරණ | දික්හේනවත්ත -කැකිරිවරාව මූකලාන |
| 5 | අකුරන්කන්ද ඇල | අකුරණ | අකුරන්කන්ද වත්ත |
| 6 | වැකඩ ඇල | අකුරණ | අකුරන්කන්ද වත්ත |
| 7 | දියහොඳ ඇල | අකුරණ | පහලකන්දවත්ත |
| 8 | කැකුණගහදොළ | යටිපව්ව | කෝදගල මූකලාන |
| 9 | බෝගොඩදොළ | යටිපව්ව | කෝදගල මූකලාන |
| 10 | කොටලපත්නල දොල | යටිපව්ව | දොස්කරවත්ත |
| 11 | කුකුලල දොළ | හාන්දුකන්ද | තලගහහේන සහ වැව්ටවත්ත මායිම |
| 12 | ජම්බුගස්පිල්ල | හාන්දුකන්ද | පිල්ලවත්ත |
| 13 | එනසාල්දොල | බ/මුදුන්කොටුව | අම්පිටියකන්ද රක්ෂිතය |
| 14 | දොරළුකන්ද රක්ෂිතයෙන් පටන්ගන්නා දිය උල්පත | බ/මුදුන්කොටුව | දොරළුකන්ද රක්ෂිතය |
| 15 | බෙරලියදොළ ඉහළ උල්පත | ඇල්ලගාව | කළුවාවලතැන්න |
| 16 | බෙරලියදොළ පහල උල්පත | ඇල්ලගාව | කළුවාවලතැන්න |
| 17 | ගොඩකුඹුරකන්ද උල්පත | හොලීපිටිය | ගොඩකුඹුරකන්ද |
| 18 | ඊරිමුල්ල තලගහකන්ද දිය උල්පත | හොලීපිටිය | තලගහකන්ද |
| 19 | රත්නමාවත්ත දිය උල්පත | හොලීපිටිය | මිල්ලකඩේ |
| 20 | අක්කර 15 දිය උල්පත | හාන්දුකන්ද | අක්කර 15 අයිති ඉඩම |
| 21 | කෝදගල මූකලාන දිය උල්පත | හාන්දුකන්ද | කෝදගල |
| 22 | ළිඳේ කඹුර දිය උල්පත | හාන්දුකන්ද | පන්සල්වත්ත |
| 23 | කිවුල ඇළ උල්පත | දෙහෙරගොඩ | කැන්දලන්ද |
| 24 | මැරෙකැලේ උල්පත | දෙහෙරගොඩ | මැරේ කැලේ රක්ෂිතය |
| 25 | කුකුළේ දොළ | එපිටවල වසම | වැව්ට වත්ත (පෞද්ගලික ඉඩමකි) |
| 26 | පල්ලෙක්කන්ද දොළ | එපිටවල | පල්ලෙක්කන්ද වත්ත |
| 27 | නාරංගස්හේන | ඉඩංගොඩ | ඉඩංගොඩවත්ත |
| 28 | හල්දොළ අමුණ | ඉඩංගොඩ | නාරංගස්හේන |
| 29 | කටුහේන | එල්ලාවල | කටුහේනවත්ත |
| අනු අංකය | ජල උල්පතේ නම | පිහිටි ග්‍රා.නි. වසම | පිහිටි ස්ථානය |

| | | | |
|---|---|---|---|
| 30 | පීල්ල දොළ | එල්ලාවල | පීල්ලදොළ |
| 31 | ඉහළකුඹුර | එල්ලාවල | ඉහළකුඹුර හේන්යාය |
| 32 | මැණික්දොළ | එල්ලාවල | මැණික්දොළ මූකලාන |
| 33 | මියනකොළතැන්න | එල්ලාවල | මියනකොලතැන්න |
| 34 | මහගලහේන | එල්ලාවල | මහගලහේන්යාය |
| 35 | එපිටවත්ත | එල්ලාවල | එපිටවත්ත කොටසක් |
| 36 | නාරංගස්හේන ජල උල්පත | කිරිඇල්ල | නාරංගස්හේන වත්ත |
| 37 | බදුවලකන්ද ජල උල්පත | කිරිඇල්ල | බදුවලකන්ද මූකලාන |
| 38 | කිරිගලහේන්යාය | කිරිඇල්ල | කිරිගලහේන |
| 39 | හිදදෙණිය ජල උල්පත 1 | කිරිඇල්ල | හිදදෙණිය හේන |
| 40 | හිදදෙණිය ජල උල්පත 2 | කිරිඇල්ල | හිදදෙණිය හේන |
| 41 | හිදදෙණිය ජල උල්පත 3 | කිරිඇල්ල | හිදදෙණිය හේන |
| 42 | ගමෙක්ගංගොඩ ජල උල්පත | කිරිඇල්ල | හිදදෙණිය හේන |
| 43 | ඕලියදෙණිය ජල උල්පත | කිරිඇල්ල | ඕලියදෙණිය වත්ත |
| 44 | දිය පොකුණ | එ/ පහලගම | නාබොක්ක |
| 45 | නාවලහේන | එ/ පහලගම | දිසානායක වත්ත |
| 46 | පරලියැද්ද ඇළ | එ/ පහලගම | වැලිපතනහේන |
| 47 | ගල්බොක්ක ඇළ | එ/ පහලගම | පිටකන්ද |
| 48 | දංකැටියදොළ | එ/පහලගම | පිටකන්ද (මනන්ඇලේ මුල් කොටස) |
| 49 | ඉත්තෑගල හේන ඇල | එ/ පහලගම | ඉත්තෑගල හේන |

## Xi. ඉතිහාසය

ඇල්ලේ දේවාලය මුල් කරගෙන සැදුම්ලත් ඇල්ලේ කපුරාලලාගේ පරම්පරාව ඇල්ලගාව ග්‍රාම නිලධාරි වසමෙහි මුල් පදිංචිකරුවන් ලෙස සැලකිය හැකිය.

යටිපච්ච ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර දෙසින් ''**කොදාගල කඳු පර්වතය**'' පිහිටා ඇත. එයට පහලින් එය පාමුල පිහිටි හෙයින් 'යටිපච්ච' යන නම මෙම ග්‍රාමයට යොදා ඇත. එහි මුල් පරම්පරාව හැටියට 'අමරසිංහ ආරච්චිගේ පරම්පරාව' හා 'අතුකෝරල පරම්පරාව' හැඳින්විය හැකිය. 'පතිරආරච්චිගේ' යනුවෙන් තුන්වෙනි පරම්පරාවක් ද පසු කාලයක බිහි වී ඇත.

'**මුනිහින්කන්ද**' වර්තමානයේ '**මුණසිංහපුර**' යනුවෙන් භාවිතා වේ. **මුණිහින්කන්ද** පරම්පරාවෙන් පැවත එන ජන කොටසක් මෙහි පදිංචි වී සිටි. දැනට කිරිඇල්ල පරණ පොලිසිය අසලින් පටන් ගන්නා රජ මාවත වැටී ඇත්තේ ''**හාන්දුකන්ද**'' ග්‍රාම නිලධාරි වසමෙහි '**කොඩිතුවක්කුකන්ද**' ගම හරහාය. රාජසිංහ රජතුමා එම මාර්ගයේ ගමන් කළ බවත්, එම මාර්ගය දෙපස නා පැල සිටවූ බවත් සඳහන් ය. පැරණි රජ සමයේ සටන්වල දි කොඩියත්, තුවක්කුවත් ගෙන පෙරට ගියේ මෙම ගම්වාසින් බවත් ඔවුනට '**කොඩිතුවක්කුකන්ද**' නමින් ගම්වරයක් වෙන් කළ බවත් ජනප්‍රවාදයේ සඳහන් වේ.

'**කබරගලකන්ද**' මුදුනින් එම ගල මතට දිය ඇල්ලක් වැටේ. එම දිය ඇල්ල අතීතයේදි කිරි පාටට ඇද හැලීම නිසා 'කිරිඇල්ල' ගමෙහි නම නිර්මාණය වි ඇත.

අකුරණ ග්‍රාම නිලධාරි වසම අකුරණ හා පහලකන්ද , යන ගම් දෙකින් සමන්විත ය. අකුරණ වෙල් යාය ආශ්‍රිතව අකුරණ යන නමින් '**අකුරණ**' ගම හැඳින්වූ බවත් අවට ප්‍රදේශයට සාපේක්ෂව පහලින් පිහිටා ඇති කඳු වැටිය යන අර්ථ ඇතිව **පහලකන්ද ගම** හඳුන්වා ඇති බවටත් තොරතුරු ඇත. මෙම ප්‍රදේශයේ බක්මහ උළෙලට පෙර අළුත් සහල් මංගල්‍යය නමින් අළුතින් අස්වනු කපා දෙවියන් උදෙසා පූජා අද දක්වා ද පැවැත්වේ. මේ සඳහා අකුරණ වෙල් යායේ එක් නියමිත ස්ථානයක් තෝරා ගැනීම කර ඇත. ගම්වැසියන් බොහෝ දෙනෙකුගේ එකමුතුවෙන් මෙම දේව පූජාව පවත්වනු ලැබේ.

'**එල්ලාවල පහලගම**' ග්‍රාම නිලධාරි වසමෙහි ප්‍රාග් ඓතිහාසික යුගයේදි මිනිස් වාසයක් තිබුණු බවට පුරා විද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හිමියන්ගේ පර්යේෂණවලින් දැන ගත හැකිය. අතීතයේ ගල්ලෙන්වල ජීවත්වූ අයගේ පරම්පරාවෙහි අය දැනුදු ජීවත් වෙති. **එල්ලාවල ගල්ලෙනගේ** යන අය එම පරම්පරාවට අයත් ය. **සිතාවක රාජධානිය** , මහනුවර යුගයේදී රාජා ගොදුරු ගමක් වූ මෙම ප්‍රදේශයේ එක් කෙලවරක පිහිටි **ගල්ලෙන් විහාරය** හා **"එල්ලාවල"** ද ඉතිහාසයට අයත් ය. සීතාවක රාජධානියේ තුන් වරක් කිරුළ හෙබවූ රාජසූරිය කුමරුන් මෙම ප්‍රදේශයේ ජීවත් වූ බව අති පූජ්‍ය කිරිඇල්ලේ ඤාණවිමල හිමියන්ගේ ''සබරගමුවේ ලියවිලි '' ග්‍රන්ථය දක්වයි. එසේ ම බ්‍රිතාන්‍යය කිරීටය සඳහා මනන්ඇල්ලෙන් හමු වූ මැණික් ගෙන ගිය බව ද ඉතිහාසය සඳහන්වේ.

සීතාවක රජතුමා ප්‍රදේශයේ සැරිසරන විට නවාතැන්පලක් වශයෙන් **දෙහෙරගොඩ** පිහිටි **කැන්දලන්ද** ප්‍රදේශයේ ස්ථානයක් තෝරාගෙන ඇත. එම ස්ථානයේ පැරණි වෙහෙරක නටබුන් ඇත. මෙහි ''මැණික් පතන'' නමින් වලක් ඇති අතර එතැනින් සොයා ගන්නා ලද රතු මැණික් ගලින් මිරිස් ගලක් කොටා ඇත. වෙහෙර තැනූ නිසා දැනට භාවිතා කරන දෙහෙරගොඩ යන නම අතීතයේ හඳුන්වා ඇත්තේ '**වෙහෙරගොඩ**' යනුවෙනි.

'**දොඩම්පෙ**' පැරණි රජවරුන්ට සේවා සැපයූ ගමකි. රජවරුන්ට සේවා සැපයූ නිසා '**දොඩම්පේ**' යන නම ලැබී ඇති බව ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාට සියලු ජ්‍යොතිෂ කටයුතු කළ '**දොඩම්පෙ ගණිතයා ගුරුන්නාන්සේ**' පදිංචිව සිටියේ මෙම ගමේ බව ද ජනප්‍රවාද වල පැවසේ. ඔහුගෙන් පැවත එන පරම්පරාව අදත් මෙහි සිටිති. සම්ප්‍රදායික චාරිත්‍ර වශයෙන් හොල්මන්, භූත වැනි දේ විශ්වාස කිරීමත් දෙවියන් පිළිබඳ විශ්වාසයත් අදත් මිනිසුන් අතර පවතී. ඒ වෙනුවෙන් කට්ටඩි ගුරුකම්, බලි තොවිල් ආදිය කිරීම අදත් පවතී

'හොලිපිටිය' ප්‍රදේශයේ අය ශ්‍රී සුමන සමන් දේවාලයට සේවා සැපයූ අය වෙති.මෙහි ඇති ගම් වැඩි කොටසක් අදත් දේවාලයට අයත් ඒවා වේ. වාර්ෂිකව පැවැත්වෙන සමන් දේවාලයේ පෙරහැර සඳහා සේවාවන් කිරිම සඳහා යාමට මෙහි ජීවත් වන වැඩි දෙනෙකුට පැවරී ඇත. සාම්ප්‍රදායික චාරිත්‍ර චාරිත්‍ර වශයෙන් මරණයක් හෝ උත්සව වැනි කටයුතුවල දි අවට සිටින අය බුලත් හුරුල්ලක් රැගෙන එම ස්ථානයට පැමිණිම සිරිතක් වශයෙන් කෙරේ.

## Xii. ඓතිහාසික හා වැදගත් ස්ථාන

### ❖ කබරගල දිය ඇල්ල ( කිරිඇල්ල)




'කිරිඇල්ල' කොට්ඨාසයේ ආරක්ෂක භටයෙකු මෙන් දැවැන්ත හස්ති රාජයෙකුගේ දසුන් මවන **'කබරගල කන්ද'** උතුර දෙසින් පිහිටා ඇත. **'කිරිඇල්ල'** ප්‍රදේශයට තෝතැන්නක් ලෙසින් **'කිරිඇල්ල'** නමින් පටබැඳිමින් ඇද හැලෙන දිය ඇල්ලෙන් කිරිඇල්ලේ අභිමානය තහවුරු කෙරේ. කිරිපාටට මෙම දිය ඇල්ල ඇද හැලෙන නිසා 'කිරිඇල්ල' යන නම පට බැඳී ඇත.

### ❖ ඇල්ලේ දේවාලය



සබරගමු පලාතේ පිහිටා ඇති දේවාල අතුරින් **'ඇල්ලේ දේවාලය'** ප්‍රසිද්ධියක් උසුලයි. පැණිගල ඇල්ල ආශ්‍රිතව මෙම දේවාලය පිහිටා ඇති නිසා 'ඇල්ලේ දේවාලය' ලෙස හඳුන්වනු ලබයි. ප්‍රදේශයේ ජනතාව විසින් මෙම දේවාලයට පුද පූජා පවත්වනු ලබන අතර 1521 වර්ෂය 'සීතාවක' හා 'රයිගම' රාජධානිය වෙන් වූ මායිම ලෙස මෙම දේවාලය නම් දරා තිබේ.

### ❖ නෑදුන් රජ මහා විහාරය -




සබරගමු පලාතේ පිහිටා ඇති ප්‍රධාන මල්වතු මහා විහාරපාර්ශවයට අයත් සියම් මහා නිකායික විහාරස්ථාන පහෙන් එකක් ලෙස 'කිරිඇල්ලේ නෑදුන් රජ මහා විහාරය' නම් දරා තිබේ. ලක් දිව අවසන් වරට රජ කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් සිය ආරාධනය අනුව මුතුවන් අකුරින් ධර්ම ග්‍රන්ථය ලියා දීම ගැන සතුටට පත්වී එම ග්‍රන්ථය රචනා කළ උගත් ධර්මධර භික්ෂූන් වහන්සේ නමක් වූ කරඳන දේව රක්ඛිත මහා ස්ථවිරයන් වහන්සේට ව්‍යංඤජනයට 'මියනදළු' කඩා ගැනීම සඳහා ඉඩම් කැබැල්ලක් පූජා කොට ඇත. මෙය අක්කර 12000 ක් පමණ වන නින්ද ගමකි. මෙම භූමි භාගය ආශ්‍රිත ව 'නෑදුන් රජ මහා විහාරය' පිහිටා ඇත.

සිරිපා අඩවියෙන් ගලා බසින කළු ගංගා නදියේ සුවබර පහස ලබමින් සැනැසෙන **කිරිඇල්ල** ගම් ප්‍රදේශය, කළු ගංගාවෙන් උතුරා යන ජල කඳට යටවන පහත් බිම් සහිත ප්‍රදේශයකින්ද, සෑම පැත්තකින්ම අහස උසට නැගී වට වී තිබෙන කඳු වළල්ලක් සහිත දර්ශනයන් ගෙන් ද, මෙම විහාර භූමිය අලංකාර වී ඇත. ගං වතුරට ඔරොත්තු දෙන ලෙස නෑදුන් ලීයෙන් මෙම විහාරය නිම කර තිබීම සුවිශේෂ කරුණකි. ලංකාවේ විශාල ම හා සුවිශේෂ ලක්ෂණයන්ගෙන් යුත් ඇත්දළ යුගලය ද මෙම විහාරය සතුව ඇත. මෙම ඇත්දළ යුගලයේ උස අඩි 7 අඟල් 7ක් පමණ වේ.

## නැදුන් රජමහා විහාරය පිළිබඳ තවත් තොරතුරු



රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලියගොඩ සිට සැතපුම් 6ක් පමණ දුරින් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මෙම පූජා භූමිය පිළිබඳ ගැඹුරු ඉතිහාසයක් ඇත.

කිරිඇල්ල නැදුන් රජමහා විහාරය සීතාවක පළමුවෙනි රාජසිංහ රජු සමයෙහි සිට ප්‍රසිද්ධියක් උසුලයි. ක්‍රි.ව 1581 සිට 1593 වකවානුවේ පළමුවෙනි රාජසිංහ රජු හින්දු ආගම වැලඳ ගැනීම නිසා මෙම විහාරය ද හුදෙකලා වූ බව පැවසේ.



මෙකල වැඩසිටි උඩකරදන දේව රක්ඛිත නම් හිමිනමකගේ අත් අකුරු කලාව ගැන පැහැදුණු පළමුවෙනි රාජසිංහ රජු තමන්ට මැදුම් සඟියක් ලියා දෙන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලා ඇත. එම ඉල්ලීම පරිදි මැදුම් සඟිය නම් ග්‍රන්ථය ලියා රජුට පිළිගැන්වීම නිසා සතුටට පත් පළවෙනි රාජසිංහ රජු විසින් අක්කර 8305 පමණ නින්දගමක් දේවරක්ඛිත හිමිට පූජා කොට ඇත. මෙම ලියවිල්ල සබරගමු මහනුවර දිසා ඇමති ලෙස කටයුතු කළ අබයකෝන් මුදියන්සේ විසින් රාජ නියෝග මත ලියවා අත්සන් කර දී ඇත. මෙම ලේඛනයට අනුව මෙම දේපල සඳහා උරුමය නැදුන් රජමහා විහාරවාසී භික්ෂූන්ට පමණි.



මෙම විහාරයේ විහාර මන්දිර තුනකි. ඉන් එක් විහාරයක් ටැම්පිට විහාරයකි. එම විහාරය නැදුන් ලීයෙන් තනා ඇත. නැදුන් ලීයෙන් තනා ඇති බුද්ධ ප්‍රතිමාවක් එහි දක්නට ඇත. එය නැදුන් ලීයෙන් සාදන ලද ආසනයක් මත තැන්පත් කර ඇත. සීතාවක යුගයේ දේව සංකල්පය ඉස්මතු වූ බැවින් සමන් දේව ප්‍රතිමා, විෂ්ණු දේව ප්‍රතිමා දක්නට ඇත. විහාරයේ මල් ආසන කිරි ගරුඬ වලින් නිමකර ඇත.




දුටුගැමුණු රජුගේ මංගල හස්තිරාජයා වූ කඩොල් ඇතුගේ ඇත්දළ යුවල මෙම විහාරයේ තැන්පත් කර ඇති බව සැලකේ. පළමු රාජසිංහ රජු විසින් පසුකාලීනව මෙම විහාරයට සැලකිල්ලක් දැක්වූ බවද හිරිහැරයක් පීඩාවක් නොකළ බවද පැවසේ.


(උපුටා ගැනීම - අන්තර්ජාලයෙනි)

## 1.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මායිම /වසම් මායිම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිතියම

### 1.2.1 කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය


උතුරින් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් ඇලපාත හා අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් ද නැගෙනහිරින් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, බටහිරින් කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද මායිම්ව ඇත.




To Eheliyagoda
Ellawela
Deheragoda
Ellawela Pahalagama
Kanuggalle
Akurana
Mudunkotuwa
Munasinghe Pura
Handukanda
Kiriella
Matuwagala
Ellagawe
Yatipahuwa
Epitawela
Idangoda
Dodampe West
Dodampe
Holipitiya
From Panadura
To Ratnapura
Ellawala Bodhiya
Ellawala Purana Viharaya
Ellawala Maha Vidyalaya
Co-Operative Shop
Matuwagala Tamil School
Thunandahena Vidyalaya
Nagoda Subodarama Viharaya
Holipitiya Purana Gallen
Legend
M.O.H. Boundary
G.N.D. Boundary
Temples
Government office
Medical Officer of Health's Office
Schools
Main Road
Scondary Road
Cart of Jeep track
Foot path
Streams
2 0 2 4 Kilometers
N
Prepaired By LUPPO, Ratnapura


## 1.2.2. වසම් මායිම් හා සිතියම්
## ඇල්ලගාව වසම-

උතුරින් නුගදණ්ඩ වසමත් නැගෙනහිරින් යටිපව්ව වසමත් දකුණින් කළුගඟත් බටහිරින් ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද මායිම් වේ.




**යටිපච්ච වසම -**

උතුරින් දකුණු කරඳනත්, නැගෙනහිරින් මුණසිංහපුර වසමත්, දකුණින් කළුගඟත් බටහිරින් ඇල්ලගාව ග්‍රාම නිලධාරී වසමින් ද මායිම් වේ.




**මුණසිංහපුර වසම-**

උතුරින් හිඳුරංගල ග්‍රාමය හා දකුණු කරඳන වසමටත්,නැගෙනහිරින් එපිටවල වසමටත්, දකුණින් කළුගඟ හා අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට හා බටහිරින් යටිපව්ව වසමටත් මායිම්ව ඇත.




**එපිටවල වසම -**

උතුරින් මුණසිංහපුර වසමින් ද,නැගෙනහිරින් හාන්දුකන්ද හා ඉඩංගොඩ වසමින් ද, දකුණින් කළු ගඟින් හා බටහිරින් මුණසිංහපුර වසමින් ද මායිම් වේ.




## හාන්දුකන්ද වසම -

උතුරට ඉන්දොළින් ද,නැගෙනහිරිට මහඇළින් ද, දකුණට පේරගස්වත්ත දොළ,කන්දවත්ත දොළ සහ දෙවක්කරවත්ත දොළින් ද බටහිරට උඩුකුඹුර දොළ හා එපිටවල වසමින් ද මායිම් වේ.




## කිරිඇල්ල වසම -

උතුරින් ගංඉම දොළින් ද නැගෙනහිරින් අකුරණ හා මාටුවාගල වසමින් ද, දකුණින් ඉඩංගොඩ වසමින් හා නාරංගස්හේනවත්ත පෙදෙසින් ද බටහිරින් කිරිඇල්ල මහ ඇල, හාන්දූකන්ද හා ඉඩංගොඩ වසමින් ද මායිම් වේ.




**ඉඩංගොඩ වසම -**

උතුරින් කිරිඇල්ල වසමින් ද, නැගෙනහිරින් මාටුවාගල වසමින් ද, දකුණින් කළු ගඟින් හා බටහිරින් එපිටවල වසමින් ද මායිම් වේ.




**හොලීපිටිය වසම -**

උතුරින් දොඩම්පෙ වසමින් ද, නැගෙනහිරින් කොස්ගල ග්‍රාමයෙන් හා කහංගම ග්‍රාමයෙන් ද දකුණින් කහංගම ග්‍රාමයෙන් ද බටහිරින් කළුගඟින් ද මායිම් වේ.




**බ/දොඩම්පේ වසම -**

උතුරින් කුරුගඟින්ද, නැගෙනහිරින් දුනු ඇල, තෙප්පනාව හා දොඩම්පෙ වසම්වලින් ද, දකුණින් කළු ගඟින් සහ බටහිරින් කුරුගඟින් ද මායිම් වේ.




**දොඩම්පේ වසම -**

උතුරින් තෙප්පනාව පහලගම වසමින් හා කිතුල්පෙ වසමින් ද, දකුණින් කළු ගඟින් ද, බස්නාහිරින් බටහිර දොඩම්පෙ වසමින් ද මායිම් වේ.




## කණුගල්ල වසම -

උතුරින් දෙහෙරගොඩ ග්‍රාමනිලධාරී වසමින් ද, නැගෙනහිරින් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් මුදුන්කොටුව ග්‍රාමනිලධාරී වසමින් ද බටහිරින් එල්ලාවල ගඟින් ද මායිම් වේ.




**අකුරණ වසම -**

උතුරින් එල්ලාවල පහලගම වසමින් ද, නැගෙනහිරින් එල්ලාවල ගඟින් ද, දකුණින් මාටුවාගල වසමින් ද, , බටහිරින් හිඳුරංගල ග්‍රාමයෙන් ද මායිම් ව ඇත.




## මාටුවාගල වසම -

උතුරින් අකුරණ වසමත් නැගෙනහිරින් එල්ලාවල ගඟත්, දකුණින් කළුගඟත් බස්නාහිරින් ඉඩංගොඩ වසම හා කිරිඇල්ල වසමින් ද මායිම් වේ.




**දෙහෙරගොඩ වසම -**

උතුරින් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, නැගෙනහිරින් කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් ද, දකුණින් කණුගල්ල ග්‍රාම නිලධාරී වසමින් හා බටහිරින් එල්ලාවල ගඟින් ද මායිම් වේ.




## බටහිර මුදුන්කොටුව වසම -

උතුරින් කණුග්ගල්ල වසමින් ද,නැගෙනහිරින් නැගෙනහිර මුදුන්කොටුව වසමින් ද දකුණින් බටහිර දොඩම්පේ වසමින් සහ බටහිරින් මාතුවාගල වසමින් ද මායිම් වේ.



## එල්ලාවල වසම -

උතුරින් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් නාකන්දල වසම හා නැඳුරණ වසමින් ද, නැගෙනහිරින් එල්ලාවල ගඟින් ද, දකුණින් එල්ලාවල පහලගම වසමින් සහ බටහිරට ඇරැපල, හිඳුරංගල වසම්වලින් ද මායිම් වේ.



## එල්ලාවල පහලගම වසම -


උතුරින් එල්ලාවල වසමින් ද, නැගෙනහිරින් එල්ලාවල ගඟින් ද, දකුණින් අකුරණ වසමින් ද බටහිරින් හිඳුරංගල හා ඇරැපොල වසම්වලින් ද මායිම් වේ.



## 1.3. ග්‍රාම නිලධාරී වසම්/ ගම්මාන හා වර්ග ප්‍රමාණය

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසමේ අංකය | ග්‍රාම නිලධාරී වසම | වර්ග ප්‍රමාණය (හෙක්ටයාර්) | අයත් ගම්මාන |
|---|---|---|---|---|
| 1 | 144 ඒ | ඇල්ලගාව | 354.4 | 1. ඇල්ලගාව 3. කළුවාවලතැන්න<br>2. කොස්හේන 4. අළුබෝගහහේන |
| 2 | 144 | යටිපව්ව | 655.6 | 5. ඇල්ලගාව<br>6. යටිපව්ව<br>7. මඩල |
| 3 | 145 සි | මුණසිංහපුර | 561.0 | 8. මුණසිංහපුර<br>9. කොටියන්ගොඩකන්ද |
| 4 | 145 ඒ | එපිටවල | 396.1 | 10. එපිටවල 12. පල්ලෙක්කන්ද<br>11. පරණ පාර 13. වරකාගොඩකන්ද |
| 5 | 145බී | ඉඩංගොඩ | 399.6 | 14. ඉඩංගොඩ ගම<br>15. නාරංගස්හේන වත්ත<br>16. කිරිඇල්ල ගම |
| 6 | 145 | කිරිඇල්ල | 307.3 | 17. කිරිඇල්ල ගම<br>18. බදුවලකන්ද |
| 7 | 145ඩී | හාන්දුකන්ද | 123.8 | 19. කොඩිතුවක්කු කන්ද ගම<br>20. හාන්දු කන්ද ගම |
| 8 | 149 ඒ | මාටුවාගල | 610.7 | 21. මාටුවාගලගම<br>22. කුරුගම්මෝදර ගම<br>23. මාටුවාගල වත්ත |
| 9 | 149 බී | අකුරණ | 399.0 | 24. පහලකන්ද<br>25. අකුරණ<br>26. දැල්වත්ත |
| 10 | 147 ඒ | එල්ලාවල පහලගම | 586.3 | 27. පහලගම ඉහල කොටස<br>28. පහලගම පහල කොටස |
| 11 | 147 | එල්ලාවල | 543.4 | 29. එල්ලාවල ගම<br>30. පිටකන්ද ගම<br>31. මැණික්දොල ගම |
| 12 | 147බි | දෙහෙරගොඩ | 539.5 | 32. ඉහලගම<br>33. දෙහෙරගොඩ<br>34. පරණගම |
| 13 | 147 සී | කණුග්ගල්ල | 248.5 | 35. කනුග්ගල්ල<br>36. රුක්හේන<br>37. හතරඅදහේන |
| 14 | 149 | බ /මුදුන්කොටුව | 514.5 | 38. පහලගම්මැද්ද 41. මාරදාවක<br>39. දිද්දෙණිය වත්ත 42. වැල්ලහේන<br>40. හිරිගොල්ල 43. අම්පිටියකන්ද |
| 15 | 150 ඒ | බ/දොඩම්පෙ | 900.1 | 44. අධිකාරිය ගම 46. තුන්අඳහේන ගම<br>45. කුරුගම්මෝදර ගම 47. මණ්ඩදෙනිය ගම |
| 16 | 150 | දොඩම්පෙ | 703.3 | 48. දොඩම්පෙ ගම 50. ගොරකඇලගම<br>49. මිල්ලකඩේ ගම 51. නාගොඩ ගම |
| 17 | 150 බී | හොලීපිටිය | 256.9 | 52. හොලීපිටිය ගම<br>53. බාලගංගොඩ ගම |
| **එකතුව** | | | **8100** | |

### 1.3.1 කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් වල පිහිටීම



## 1.4. වසම අයත් රෙජිස්ට්‍රාර් කොට්ඨාසය

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසමේ අංකය | ග්‍රාම නිලධාරී වසම | රෙජිස්ට්‍රාර් කොට්ඨාසය |
|---|---|---|---|
| 1 | 144/ ඒ | ඇල්ලගාව | කරඳන |
| 2 | 144 | යටිපච්ච | කරඳන |
| 3 | 145/ සී | මුණසිංහපුර | කිරිඇල්ල |
| 4 | 145/ ඒ | එපිටවල | කිරිඇල්ල |
| 5 | 145/බී | ඉඩංගොඩ | කිරිඇල්ල |
| 6 | 145 | කිරිඇල්ල | කිරිඇල්ල |
| 7 | 145/ඩී | හාන්දුකන්ද | කිරිඇල්ල |
| 8 | 149 /ඒ | මාටුවාගල | එල්ලාවල, දොඩම්පේ |
| 9 | 149 /බී | අකුරණ | එල්ලාවල |
| 10 | 147 /ඒ | එල්ලාවල පහලගම | එල්ලාවල |
| 11 | 147 | එල්ලාවල | එල්ලාවල |
| 12 | 147/බී | දෙහෙරගොඩ | එල්ලාවල |
| 13 | 147/ සී | කනුග්ගල්ල | එල්ලාවල |
| 14 | 149 | මුදුන්කොටුව | දොඩම්පේ |
| 15 | 150 /ඒ | බ/දොඩම්පෙ | දොඩම්පේ |
| 16 | 150 | දොඩම්පෙ | දොඩම්පේ |
| 17 | 150 /බී | හොලීපිටිය | දොඩම්පේ |

**මූලාශ්‍ර - කිරිඇල්ල රෙජිස්ට්‍රාර් අංශය**

## 1.5. කොට්ඨාසයේ පරිපාලන ව්‍යුහය

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම | ගම්මාන සංඛ්‍යාව | ගොවි කේන්ද්‍ර සංඛ්‍යාව | පලාත්පාලන ආයතන සංඛ්‍යාව | | | පොලිස් බල ප්‍රදේශය | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | නගර සභා | ප්‍රාදේශීය සභා | ප්‍රාදේශීය සභා උප කාර්යාල | | |
| 1 | 144 / යටිපව්ව | 3 | - | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 2 | 144/ ඒ ඇල්ලගාව | .4 | - | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 3 | 145 / කිරිඇල්ල | 2 | - | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 4 | 145/ ඒ එපිටවල | 4 | 1 | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 5 | 145 /බී ඉඩංගොඩ | 3 | - | - | - | 1 | කිරිඇල්ල | කිරිඇල්ල |
| 6 | 145/ සී මුණසිංහපුර | 2 | - | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 7 | 145 /ඩී හාන්දූකන්ද | 2 | - | - | - | - | කිරිඇල්ල | කිරිඇල්ල |
| 8 | 147 / එල්ලාවල | 3 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 9 | 147/ඒ පහලගම | 2 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 10 | 147 බී දෙහෙරගොඩ | 3 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 11 | 147/ සී කනුග්ගල්ල | 3 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 12 | 149 / මුදුන්කොටුව | 6 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 13 | 149 /ඒ මාටුවාගල | 3 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 14 | 149 /බී අකුරණ | 3 | - | - | - | - | ඇහැලියගොඩ | කිරිඇල්ල |
| 15 | 150 / දොඩම්පෙ | 4 | 1 | - | - | - | රත්නපුර | කිරිඇල්ල |
| 16 | 150 ඒ /බ/දොඩම්පෙ | 4 | - | - | - | - | රත්නපුර | කිරිඇල්ල |
| 17 | 150 /බී හොලීපිටිය | 2 | - | - | - | 1 | රත්නපුර | කිරිඇල්ල |
| **එකතුව** | | **53** | **2** | | | **2** | | |

## 1.6 කොට්ඨාසයේ පළාත් පාලන ආයතනය පිළිබඳ විස්තර

| පලාත් පාලන ආයතනයේ නම | ඇස්තමේන්තු ජනගහනය | විශාලත්වය (ව.කි.මී) | ඡන්ද දායකයින් සංඛ්‍යාව | අයත් වසම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කුරුවිට ප්‍රාදේශීය සභාව | 138,886 | 263.10 | 101,623 | 56 |

කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අයත් වන්නේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටයි. එම කාර්යාලය කුරුවිට නගරයේ පිහිටා ඇත. කුරුවිට ප්‍රාදේශීය සභා උප කාර්යාල දෙකක් පමණක් මෙම කොට්ඨාසයේ පිහිටා ඇත.

කුරුවිට ප්‍රාදේශීය සභා උප කාර්යාලය - කිරිඇල්ල

කුරුවිට ප්‍රාදේශීය සභා උප කාර්යාලය - දොඩම්පේ